# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2009 අංක 12 දරන ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 මාර්තු මස 20 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 මාර්තු මස 20 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. **14.00 යි.** **තැපැල් ගාස්තුව :** රු. **7.50 යි.**

# 2009 අංක 12 දරන ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය පනත

[සහතිකය සටහන් කළේ 2009 මාර්තු මස 20 වන දින]

එල්.ඩී.—ඕ. 66/2006.

**ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ; පේෂකර්ම හා නිමි ඇඳුම් කර්මාන්තය සංවර්ධනය කිරීමට සහ එහි තිරසාරභාවය සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ; දේශීය හා විදේශීය ශිෂ්‍යයන් උදෙසා පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණය, කළමනාකරණය කිරීම සහ අදාළ ක්ෂේත්‍ර පිළිබඳව පුහුණු වැඩසටහන් සහ වැඩමුළු පැවැත්වීම පිණිස ද ; විදේශ රටවල් සඳහා තාක්ෂණික හා උපදේශන සේවා සැපයීම පිණිස ද ; 1984 අංක 3 දරන ඇඟලුම් නිෂ්පාදන කර්මාන්ත අභ්‍යාස ආයතනය පනත සහ 1984 අංක 4 දරන පේෂකර්ම අභ්‍යාස සහ සේවා මධ්‍යස්ථානය පනත ඉවත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ; ඊට සම්බන්ධ සහ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

පූර්විකාව.

1984 අංක 3 දරන ඇඟලුම් නිෂ්පාදන කර්මාන්ත අභ්‍යාස ආයතනය පනත මගින් ඇඟලුම් කර්මාන්තය පිළිබඳව පුහුණුව හා තාක්ෂණික සේවා සැපයීම සඳහා ඇඟලුම් නිෂ්පාදන කර්මාන්ත අභ්‍යාස ආයතනය පිහිටුවනු ලැබූ හෙයින් ද :

1984 අංක 4 දරන පේෂකර්ම අභ්‍යාස සහ සේවා මධ්‍යස්ථානය පනත මගින් පේෂ කර්මාන්තය පිළිබඳ පුහුණුව, උපදේශනය සහ තාක්ෂණික සේවා සැපයීම සඳහා පේෂකර්ම අභ්‍යාස සහ සේවා මධ්‍යස්ථානය පිහිටුවනු ලැබූ හෙයින් ද :

ඇඟලුම් නිෂ්පාදන කර්මාන්ත අභ්‍යාස ආයතනය සහ පේෂකර්ම අභ්‍යාස සහ සේවා මධ්‍යස්ථානය මගින් භාවිත කරනු ලබන සම්පත් සහ උපකරණ රාශියක් එකී ආයතන දෙක අතර හවුලේ පරිහරණය කරනු ලබන අතර, එම ආයතන දෙක ම දැනට පේෂකර්ම හා ඇඟලුම් කර්මාන්තය පිළිබඳ සමාන සේවා සලසන බැවින් ද :

එකී ඇඟලුම් නිෂ්පාදන කර්මාන්ත අභ්‍යාස ආයතනය සහ පේෂකර්ම අභ්‍යාස සහ සේවා මධ්‍යස්ථානය යන ආයතන දෙක එක් කිරීමෙන් එකී ආයතන දෙක පවත්වාගෙන යාමේ ක්‍රියාකාරී වියදම අඩුකර, එමගින් මෙම ආයතන දෙක මගින් සපයනු ලබන සේවා මෙයින් පිහිටුවනු ලබන ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය මගින් ඒකාබද්ධව සිදු කිරීමට අවශ්‍යව ඇති හෙයින් ද :

2—PL 003128 -3,500 (2008/08)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

1. මේ පනත 2009 අංක 12 දරන ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, මේ වගන්තිය හැර මේ පනතේ සෙසු විධිවිධාන (මෙහි මින්මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 80 වන ව්‍යවස්ථාවේ (1) වන ඡේදය ප්‍රකාරව, කථානායකවරයාගේ සහතිකය, ඔහුගේ අත්සන ඇතිව සටහන් කරනු ලැබූ විට, මේ වගන්තියේ විධිවිධාන බලාත්මක වන්නේ ය.

## I වන කොටස

### ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය පිහිටුවීම

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය පිහිටුවීම.

2. (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය යනුවෙන් හඳුන්වනු ලබන ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු අතර, එම ආයතනය වෙත මේ වගන්තිය මගින් පවරා දී ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය ; තව ද, එහි සංස්ථාපිත නාමයෙන් එය විසින් හා එයට විරුද්ධව නඩු පවරනු ලැබිය හැකි ය.

පාලක මණ්ඩලයේ සංයුතිය.

3. (1) ආයතනයට (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක මණ්ඩලයක් තිබිය යුතු අතර, එය—

(අ) පහත දැක්වෙන නිල බලයෙන් පත් වන සාමාජිකයන්ගෙන්, එනම් :—

(i) මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු පේෂ කර්මාන්ත හා ඇඟලුම් කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ වෙනත් යම් නිලධරයකුගෙන් ;

(ii) ව්‍යවසාය සංවර්ධන සහ ආයෝජන ප්‍රවර්ධන විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නිලධරයකුගෙන් ;

(iii) කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නිලධරයකුගෙන් ;

(iv) උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නිලධරයකුගෙන් ;

(v) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නිලධරයකුගෙන් ; සහ

(ආ) (මෙහි මින් මතු “පත් කළ සාමාජිකයන් ” යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කළ යුතු පහත සඳහන් සාමාජිකයන්ගෙන්, එනම් :—

(i) පේෂකර්ම නිෂ්පාදන කර්මාන්තයේ සහ පේෂකර්ම අපනයන කර්මාන්තයේ නියැලී සිටින තැනැත්තන් අතුරින් දෙදෙනකුගෙන් ;

(ii) 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද ජොයින්ට් ඇපරල් ඇසෝසියේෂන් ෆෝරම් නියෝජනය කරනු ලබන තැනැත්තන් තිදෙනකුගෙන් ;

(iii) පේෂකර්ම හෝ ඇඟලුම් තාක්ෂණවේදයට අදාළව ශාස්ත්‍රීය පාඨමාලා හෝ පුහුණුකිරීම් පැවැත්වීමෙහි නියැලී සිටින ශාස්ත්‍රීය හෝ වෘත්තීයමය ආයතන නියෝජනය කරනු ලබන තැනැත්තන් දෙදෙනකුගෙන්,

සමන්විත විය යුතු ය.

(2) ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම පිළිබඳව මණ්ඩලය වගකිව යුතු ය.

(3) මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුර කාලය, සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික, මණ්ඩලයේ රැස්වීම් සහ මණ්ඩලයේ මුද්‍රාව යන කරුණුවලට අදාළව මේ පනතේ උපලේඛනයේ විධිවිධාන බලාත්මක විය යුතු ය.

4. ආයතනය පිහිටුවනු ලබන්නේ යම් පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු ය :— ආයතනයේ පරමාර්ථ.

(අ) පශ්චාත් උපාධි සහ උපාධි වැඩසටහන් පැවැත්වීම සහ පේෂකර්ම හා ඇඟලුම් කර්මාන්තයේ නියැලී සිටින තැනැත්තන්ට ඩිප්ලෝමා මට්ටමේ අධ්‍යාපනය, පුහුණුව සහ උපදේශන හා තාක්ෂණික සේවා සැපයීම ;

(ආ) පේෂකර්ම සහ ඇඟලුම් තාක්ෂණවේදය, කළමනාකරණය සහ වෙනත් අදාළ ක්ෂේත්‍ර පිළිබඳව ජාතික ප්‍රමිතීන් සකස් කිරීම සහ ඒවා සම්බන්ධයෙන් සහතික ප්‍රදානය කිරීම ;

(ඇ) පේෂකර්ම හා ඇඟලුම් කර්මාන්තය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා ආණ්ඩුවට සහාය වීම ;

(ඈ) විදේශීය ආයතන, කර්මාන්ත සහ රසායනාගාර සමග සම්බන්ධ වීම සහ ප්‍රතීතන සහ විද්‍යාගාර සේවා සැපයීම හා ඒවා සම්බන්ධයෙන් උසස් ප්‍රමිතියක් පවත්වා ගනිමින් පාඨමාලා පැවැත්වීම ;

(ඉ) පේෂකර්ම හා ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රවලට අදාළව උපාධි, පශ්චාත් උපාධි, ඩිප්ලෝමා සහ සහතික ප්‍රදානය කිරීමේ අරමුණින් දේශීය හා විදේශීය විශ්වවිද්‍යාල සහ ආයතන සමග සබඳතා පැවැත්වීම ;

(ඊ) රාජ්‍ය ආයතන, දේශීය හා විදේශීය ශාස්ත්‍රීය සංවිධාන, ආයතන සහ කර්මාන්තායතන සමග පේෂකර්ම හා ඇඟලුම් කර්මාන්තය පිළිබඳව සහයෝගයෙන් පර්යේෂණ කිරීම සහ නිෂ්පාදනය වැඩි දියුණු කිරීම ප්‍රවර්ධනය කිරීම ;

(උ) දේශීය හා විදේශීය ආයතනවලට සහ දේශීය සහ විදේශීය ශිෂ්‍යයන්ට ගාස්තු අය කිරීමේ පදනම මත පේෂකර්ම හා ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රවලට අදාළ පර්යේෂණ හා වෙනත් අදාළ තාක්ෂණික උපදේශන සේවා ලබා දීම ;

(ඌ) පේෂකර්ම හා ඇඟලුම් කර්මාන්තයේ භාවිත කරනු ලබන පිරිවිතර සහ යන්ත්‍රෝපකරණ පිළිබඳ වෙළෙඳපල සමීක්ෂණ, තාක්ෂණික හා ආර්ථික ශක්‍යතා අධ්‍යයන, ව්‍යාපෘති අගැයීම් සහ තක්සේරු කිරීම් පැවැත්වීම ;

(එ) නිෂ්පාදනය, ආනයනය හා අපනයනය සහ වෙනත් තාක්ෂණික තොරතුරු ඇතුළත් පේෂකර්මය සහ ඇඟලුම් කර්මාන්තය පිළිබඳව දත්ත මූලාශ්‍රයන් පවත්වාගෙන යාම ; සහ

(ඒ) ජාත්‍යන්තර හා ජාතික ප්‍රමිතිවලට සහ සමාගම් ප්‍රමිති පද්ධතිවලට අනුකූලව පේෂකර්ම හා ඇඟලුම් කර්මාන්තයේ නියැලී සිටින තැනැත්තන්ට අනුකූලතා සහතික නිකුත් කිරීම.

**5.** ආයතනයේ කටයුතු පරිපාලනය කිරීමේ දී මණ්ඩලය විසින් පහත දැක්වෙන බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම කළ යුතු ය :—

ආයතනයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය.

(අ) පේෂකර්ම හා ඇඟලුම් කර්මාන්තයේ සියළු අංශ පිළිබඳ පර්යේෂණ පැවැත්වීම, ඒවාට සහාය වීම, සම්බන්ධීකරණය කිරීම සහ දිරිමත් කිරීම ;

(ආ) ප්‍රතීතන සේවා සඳහා දේශීය හා විදේශීය ආයතන හා රසායනාගාර සමග ගිවිසුම්වලට ඇතුළත් වීම සහ පර්යේෂණ සේවා සඳහා ප්‍රමිතීන් සකස් කිරීම ;

(ඇ) පේෂකර්ම හා ඇඟලුම් කර්මාන්තය පිළිබඳ සියලු අංශවලට අදාළ අධ්‍යාපනය සහ පුහුණුව ලබා දීම සඳහා දේශීය හා විදේශීය විශ්ව විද්‍යාල හා වෙනත් වෘත්තීය ආයතන සමග ගිවිසුම්වලට එළඹීම ;

(ඈ) ආයතනයේ කාර්යය සඳහා අවශ්‍ය පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ ආනයනය කිරීම සහ ආයතනයේ කටයුතු ඵලදායී ලෙස පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය උපකරණ, අරමුදල්, සේවක පිරිස් සහ වෙනත් සහාය ලබා ගැනීම ;

(ඉ) ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් පිටත සාකච්ඡා, වැඩමුළු සහ සම්මන්ත්‍රණ සඳහා අනුග්‍රහය දැක්වීම හා පැවැත්වීම සහ පේෂකර්ම හා ඇඟලුම් කර්මාන්තයට අදාළව වාර සඟරා සහ සඟරා පළ කිරීම ;

(ඊ) පේෂකර්ම සහ ඇඟලුම් කර්මාන්තයට අදාළ ක්ෂේත්‍ර පුහුණු මධ්‍යස්ථාන අත්කර ගැනීම, පිහිටුවීම, සවි කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ නියමු ව්‍යාපෘති කරගෙන යාම ;

(උ) ආයතනය විසින් සලසනු ලබන සියළු සේවා සඳහා ගාස්තු සහ අයකිරීම් ලබා ගැනීම ;

(ඌ) ආයතනයේ කටයුතු පරිපාලනය කිරීමට අදාළව අවශ්‍ය විය හැකි කාරණා සම්බන්ධයෙන් රීති සෑදීම ;

(එ) යම් නිශ්චල හෝ චංචල දේපළ කවර ආකාරයකින් හෝ අත්කර ගැනීම සහ එම දේපළ දැරීම, බද්දට හෝ කුලියට ලබා ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ඒ) මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකනු ලබන මණ්ඩලයේ යම් බලතල, කාර්යය සහ කර්තව්‍ය මණ්ඩලයේ යම් සාමාජිකයකු වෙත, අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යම් අධ්‍යක්ෂවරයකු වෙත හෝ ආයතනයේ වෙනත් සේවා නියුක්තයකු වෙත අභිනියෝජනය කිරීම ;

(ඔ) ආයතනයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය යයි මණ්ඩලයේ මතය අනුව සලකනු ලබන යම් විමර්ශනයක් පැවැත්වීම සහ දත්ත වාර්තා කර ගැනීම, පොත්පත් සහ ලේඛන පරීක්ෂා කිරීම සහ එම ලේඛනවල පිටපත් හෝ උද්ධෘත ලබා ගැනීම යන කාර්යය සඳහා යම් සාධාරණ වේලාවක් තුළදී, යම් ඉඩමක හෝ පරිශ්‍රයක අයිතිකරුගේ, පදිංචිකරුගේ හෝ එය භාරව සිටින තැනැත්තාගේ කැමැත්ත ඇතිව එම ඉඩමට හෝ පරිශ්‍රයට ඇතුළුවීම ; සහ

(ඕ) මණ්ඩලයේ මතය අනුව ආයතනයේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ හෝ හිතකර වන්නා වූ හෝ ආනුෂංගික වන්නා වූ වෙනත් සියළු දේ කිරීම.

මණ්ඩලය විසින් ස්වකීය බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම ආණ්ඩුවේ පොදු ප්‍රතිපත්තියට අනුකූලව සිදු කළ යුතු බව.

**6.** මණ්ඩලය විසින් ස්වකීය බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේදී පේෂකර්ම හා ඇඟලුම් කර්මාන්තයට අදාළ ආණ්ඩුවේ සාමාන්‍ය ප්‍රතිපත්තිවලට සහ එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අදාළව අමාත්‍යවරයා විසින් කලින් කලට නිකුත් කරනු ලැබිය හැකි සාමාන්‍ය හෝ විශේෂ විධානවලට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කළ යුතු ය.

බලතල අභිනියෝජනය කිරීම.

**7.** (1) මණ්ඩලය විසින් ස්වකීය බලතල, කාර්යය හෝ කර්තව්‍යවලින් යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් මණ්ඩලයේ සභාපතිවරයා වෙත හෝ වෙනත් යම් සාමාජිකයකු වෙත නැතහොත් ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත, අධ්‍යක්ෂවරයකු වෙත හෝ වෙනත් යම් සේවා නියුක්තයකු වෙත අභිනියෝජනය කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් අභිනියෝජනය කරනු ලැබුවේ යම් තැනැත්තකු වෙත ද, එම තැනැත්තා විසින් මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව එම බලය, කාර්යය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම කළ යුතු ය.

## II වන කොටස

### ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා, අධ්‍යක්ෂවරු සහ කාර්ය මණ්ඩලය පත් කිරීම

ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ අධ්‍යක්ෂවරුන්.

8. (1) අමාත්‍යවරයා විසින් මණ්ඩලය විමසා (මේ පනතේ "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කරනු ලැබිය යුතු අතර, ඔහු ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සේවා නියුක්තිය පිළිබඳව නියම හා කොන්දේසි සහ ඔහුට ගෙවිය යුතු පාරිශ්‍රමිකය අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා නිශ්චය කළ යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මණ්ඩලයේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත්ව ආයතනයේ කටයුතු මෙහෙයවීම භාරව සිටිය යුතු අතර, මණ්ඩලය විසින් ඔහුට පවරනු ලබන කාර්යය සහ කර්තව්‍ය කිරීම සහ ඉටු කිරීම ද කළ යුතු ය.

(3) මණ්ඩලය විසින් ආයතනයට අධ්‍යක්ෂවරුන් වශයෙන් තැනැත්තන් දෙදෙනකු පත් කළ යුතු අතර, ඒ එක් එක් අධ්‍යක්ෂවරයා ආයතනයේ වෙන් වෙන් වශයෙන් වූ අංශ භාරව සිටිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ අධ්‍යක්ෂවරුන්, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සාමාන්‍ය අධීක්ෂණයට යටත්ව ඔවුන් වෙත භාර දෙනු ලැබූ අංශවලට අදාළව ඔවුන්ගේ කාර්යය සහ කර්තව්‍ය ඉටු කිරීම සහ කිරීම කළ යුතු ය.

(5) අවස්ථාවෝචිත පරිදි, අමාත්‍යවරයා හෝ මණ්ඩලය විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ (3) වන උපවගන්තිය යටතේ පත් කරන අධ්‍යක්ෂවරුන් හේතු දැක්වීමෙන් අනතුරුව, ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(6) මිය යාම, විශ්‍රාම ගැනීම, (5) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කිරීම හෝ අවස්ථාවෝචිත පරිදි, අමාත්‍යවරයා හෝ මණ්ඩලය අමතා තත්කාර්යය සඳහා යවන ලද ලිපියක් මගින් ඉල්ලා අස්වීම මත, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ හෝ අධ්‍යක්ෂවරු දෙදෙනාගෙන් යම් අයකුගේ ධුරය, හිස් වන්නේ ය.

(7) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ධුරයේ හෝ අධ්‍යක්ෂවරුන්ගේ ධුරවල පුරප්පාඩුවක් ඇති වූ අවස්ථාවක, එම පුරප්පාඩුව පිරවීම සඳහා (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ පත්වීමක් සිදු කරන තුරු, අවස්ථාවෝචිත පරිදි, අමාත්‍යවරයා හෝ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ හෝ අධ්‍යක්ෂවරයාගේ ධුරයේ කාර්යය සහ කර්තව්‍ය ඉටු කිරීම සහ කිරීම සඳහා මණ්ඩලයේ යම් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

ආයතනයේ කාර්ය මණ්ඩලය.

**9.** මේ පනතේ විධිවිධානවලට සහ එය යටතේ සාදන ලද යම් රීතියකට යටත්ව, මණ්ඩලයේ බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, කිරීමට සහ ඉටු කිරීමට අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලබන නිලධරයන් සහ සේවකයන් මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි අතර, තව දුරටත් මණ්ඩලය විසින්—

(අ) අධ්‍යක්ෂවරුන්ට, නිලධරයන්ට සහ වෙනත් සේවා නියුක්තයන්ට ගෙවිය යුතු වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නිශ්චය කළ යුතු ය ;

(ආ) ආයතනයේ අධ්‍යක්ෂවරු, නිලධරයන් සහ වෙනත් සේවා නියුක්තයන් ඉවත් කිරීම ඇතුළුව, විනය පාලනය ක්‍රියාත්මක කළ යුතු ය ; සහ

(ඇ) අධ්‍යක්ෂවරුන්ගේ, නිලධරයන්ගේ සහ සේවා නියුක්තයන්ගේ සේවය පිළිබඳ නියම හා කොන්දේසි නිශ්චය කළ යුතු ය.

ආයතනයේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම.

**10.** (1) මණ්ඩලයේ ඉල්ලීම පරිදි රාජ්‍ය සේවයේ යම් නිලධරයකු එම නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන කාලයක් සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එම නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ආයතනයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එම නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) යම් නිශ්චිත කාලයක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ඇති යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයේ නියුක්ත කරනු ලැබ ඇති අවස්ථාවක දී, එම තැනැත්තා විසින් ආයතනයට සේවය කරනු ලබන යම් කාලයක් එම ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට සේවය කරනු ලබන කාලයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලයේ ඉල්ලීම පරිදි පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ පළාත් පාලන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු, අවස්ථාවෝචිත පරිදි, එම සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ සහ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ හෝ පළාත් පාලන ආයතනයේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන කාලයක් සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව විශ්‍රාම වැටුප් හෝ අර්ථ සාධක අරමුදල් අයිතිවාසිකම්වලට අදාළ නියම සහ කොන්දේසි ද ඇතුළුව, අවස්ථාවෝචිත පරිදි, ආයතනය සහ පළාත් පාලන සේවා කොමිෂන් සභාව හෝ එම පළාත් පාලන ආයතනය එකඟ වන නියම හා කොන්දේසි මත, ඒ සාමාජිකයා, නිලධරයා හෝ සේවකයා ආයතනයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(6) මණ්ඩලයේ ඉල්ලීම පරිදි, රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු, එම නිලධරයාගේ හෝ සේවකයාගේ සහ එම රාජ්‍ය සංස්ථාවේ පාලක මණ්ඩලයේ කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් කාල සීමාවක් සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව විශ්‍රාම වැටුප් හෝ අර්ථ සාධක අරමුදල් අයිතිවාසිකම්වලට අදාළ නියම සහ කොන්දේසි ඇතුළු මණ්ඩලය සහ එම රාජ්‍ය සංස්ථාවේ පාලක මණ්ඩලය එකඟ වන වෙනත් නියම සහ කොන්දේසි මත, එම නිලධරයා හෝ සේවකයා ආයතනයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(7) මේ වගන්තියේ (5) වන හෝ (6) වන උපවගන්ති යටතේ යම් තැනැත්තකු ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම, එම තැනැත්තා ද යටත් විය යුතු ය.

## III වන කොටස

## මුදල්

ආයතනයේ අරමුදල.

**11.** (1) ආයතනයට එහි ම අරමුදලක් තිබිය යුතු අතර, එම අරමුදලට පහත දැක්වෙන මුදල් බැර කරනු ලැබිය යුතු ය :—

(අ) ආයතනයේ කාර්යය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියළු මුදල් ;

(ආ) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේදී සහ කිරීමේදී ආයතනයට ලැබෙන මුදල්වලින්, 12 වන වගන්තිය යටතේ පිහිටුවන ලද කාර්ය මණ්ඩලය සංවර්ධන අරමුදලට යම් මුදලක් බැර කිරීමෙන් පසු, ඉතිරි වන මුදල් ;

(ඇ) ශ්‍රී ලංකාව ඇතුලත හෝ ඉන් පිටත කවර හෝ ප්‍රභවයකින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග වශයෙන් ආයතනයට ලැබෙන සියළු මුදල් ; සහ

(ඈ) මේ පනතේ 30 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ අරමුදලට පවරනු ලබන සියළු මුදල්.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ කිරීමේ දී ආයතනය විසින් දරනු ලබන වියදම් පියවීම සඳහා අවශ්‍ය සියළු මුදල්, අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

කාර්ය මණ්ඩලය සංවර්ධන අරමුදල.

**12.** (1) ආයතනයේ කාර්ය මණ්ඩලයේ නිපුණතාව සහ දැනුම වර්ධනය කිරීමේ කාර්යය සඳහා මණ්ඩලය විසින් කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදලක් පිහිටුවනු ලැබිය හැකි ය.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී ආයතනය වෙත ලැබුණ ආදායමින් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ප්‍රතිශතයක්, වාර්ෂිකව කාර්ය මණ්ඩලය සංවර්ධන අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදල නිසි පරිදි පරිපාලනය කිරීමේ සහ පවත්වාගෙන යාමේ වගකීම මණ්ඩලය විසින් දරනු ලැබිය යුතු අතර, එම අරමුදල වාර්ෂිකව විගණනය කිරීම සඳහා කටයුතු සලස්වනු ලැබිය යුතු ය. ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, එම විගණනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

13. මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්යය සහ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා ආයතනයට අවශ්‍ය මුදල්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ආයතනය විසින් අයිරා වශයෙන් හෝ අන්‍යාකාරයකට ණයට ගැනීම හෝ ණයවර කොන්දේසි මත සාකච්ඡා කර ලබා ගැනීම හෝ සිදු කළ හැකි ය : ආයතනය විසින් ණය ගැනීමේ බලතල.

එසේ වුව ද, මේ වගන්තිය යටතේ ආයතනය විසින් ණයට ගත් යම් මුදලක් සම්බන්ධයෙන් ගෙවීමට ඇති හිඟ මුදල්වල එකතුව කවර අවස්ථාවක දී වුව ද, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන යම් මුදල් ප්‍රමාණයකට වඩා කිසිදු විටක වැඩි නොවිය යුතු ය.

14. (1) ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. මුදල් වර්ෂය සහ ආයතනයේ ගිණුම් විගණනය කිරීම.

(2) ආයතනයේ ආදායම් සහ වියදම, වත්කම්, බැරකම්, සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි පරිදි ගිණුම් පොත් තැබීමට, මණ්ඩලය කටයුතු සැලැස්විය යුතු ය.

(3) ගිණුම් විගණනය කිරීමට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ ඇති විධිවිධාන, ආයතනයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

15. ආයතනයේ මුදල් පාලනය සහ ගිණුම් සම්බන්ධයෙන්, 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය. 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටස අදාළ වීම.

මණ්ඩලයේ කටයුතු පිළිබඳව මණ්ඩලය විසින් වාර්ෂික වාර්තාවක් පිළියෙල කළ යුතු බව.

**16.** එක් එක් මුදල් වර්ෂයක් අවසානයේ මණ්ඩලය විසින් එම වර්ෂය තුළ එහි ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තාවක් ප්‍රකාශයට පත් කළ යුතු අතර එය අනුමතය සඳහා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. අමාත්‍යවරයා විසින් අනුමත කිරීමෙන් පසු, එම වාර්තාව පාර්ලිමේන්තුවෙහි සභාගත කළ යුතු ය.

## IV කොටස

## පොදු විධිවිධාන

ගොඩනැගිලි සහ පරිශ්‍රවලට ඇතුළුවීම සහ ඒවා පරීක්ෂා කිරීම.

**17.** (1) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, ඉටු කිරීමේ හෝ කිරීමේ කාර්යය සඳහා යම් පරීක්ෂණයක් හෝ විමර්ශනයක් පැවැත්වීමේ හෝ යම් දත්තයක් වාර්තාගත කිරීමේ කාර්යය සඳහා, මණ්ඩලය විසින් විශේෂයෙන් ලිඛිතව බලය පවරන ලද ආයතනයේ යම් නිලධරයකු හෝ සේවා නියුක්තයකු, යම් සාධාරණ වේලාවක් තුළදී යම් ගොඩනැගිල්ලකට හෝ පරිශ්‍රයකට ඇතුළුවීම නීත්‍යනුකූල වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් පරීක්ෂණයක් හෝ විමර්ශනයක් පැවැත්වීමේ හෝ යම් දත්තයක් වාර්තාගත කිරීමේ කාර්යය සඳහා යම් ගොඩනැගිල්ලකට හෝ පරිශ්‍රයකට ඇතුළු වීම සඳහා වූ කැමැත්ත, අවස්ථාවෝචිත පරිදි, එම ගොඩනැගිල්ලේ හෝ පරිශ්‍රයේ අයිතිකරුගෙන් හෝ පදිංචිකරුගෙන් හෝ එය භාරව සිටින තැනැත්තාගෙන් ලබා ගත යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ලබා ගැනීමට නියමිත කැමැත්ත ලබා දීම අසාධාරණ ලෙස ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, එම ගොඩනැගිල්ල හෝ පරිශ්‍රය පිහිටි ප්‍රදේශය පිළිබඳ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයාගෙන් මණ්ඩලය විසින් සෝදිසි වරෙන්තුවක් ලබා ගත හැකි අතර, එම සෝදිසි වරෙන්තුවේ නම් කර ඇති නිලධරයාට, අවස්ථාවෝචිත පරිදි, එම ගොඩනැගිල්ලට හෝ පරිශ්‍රයට ඇතුළු වී එය පරීක්ෂා කිරීමට, විමර්ශනය කිරීමට හෝ දත්ත වාර්තාගත කිරීමට එමගින් බලය පවරා තිබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ තම කාර්යය ඉටු කිරීමේ දී ආයතනයේ යම් නිලධරයකුට හෝ සේවා නියුක්තයකුට බාධා කරන සෑම තැනැත්තෙක් ම, මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

**18.** (1) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට හෝ කිරීමට ආයතනයට හැකි කරවීමේ කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා, අධ්‍යක්ෂවරයකු නැතහොත් මණ්ඩලය විසින් තත්කාර්යය සඳහා ලිඛිතව බලය පවරන ලද යම් නිලධරයකු හෝ සේවා නියුක්තයකු විසින්, ලිඛිත දැන්වීමක් නිකුත් කරමින්, පේෂකර්ම හා ඇඟලුම් කර්මාන්තයට අදාළව ඔහු දන්නා යම් කාරණාවකට අදාළ එමෙන්ම නිකුත් කළ දැන්වීමේ නිශ්චිතව දැක්වෙන තොරතුරු හෝ දැන්වීමෙහි සඳහන් යම් ලේඛනයක්, එම දැන්වීමෙහි නිශ්චිතව දැක්වෙන කාලයක් තුළ ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය.

තොරතුරු ඉල්ලා සිටීමට ඇති බලය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් මගින් යම් තොරතුරු ඉදිරිපත් කරන ලෙස හෝ යම් ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකුට ද, යම් නීතියක විධිවිධාන යටතේ එම තොරතුරු හෙළි කිරීමෙන් එම තැනැත්තා වළක්වනු ලැබ ඇති අවස්ථාවක හෝ එම තොරතුරු එම තැනැත්තා නොදන්නා අවස්ථාවක හෝ එම තැනැත්තා සන්තකයේ එම තොරතුරු නොමැති අවස්ථාවක දී හැර, එම දැන්වීමේ සඳහන් කාලය ඇතුළත ඊට අනුකූලව ක්‍රියා කිරීම, එම තැනැත්තාගේ කාර්යය වන්නේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කළ දැන්වීමකට අනුකූලව ඉදිරිපත් කරන ලද යම් තොරතුරක් හෝ ඉදිරිපත් කරන ලද යම් ලේඛනයක ඇතුළත් කරුණු අවස්ථාවෝචිත පරිදි, එම තොරතුරු හෝ එම ලේඛන ඉදිරිපත් කළ තැනැත්තාගේ කැමැත්ත ඇතිව මිස හෝ මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී හා කිරීමේ දී හැර මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කිරීම හෝ වෙනත් තැනැත්තකුට සන්නිවේදනය කිරීම නොකළ යුතු ය.

**19.** මණ්ඩලයේ බලතල, කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ කිරීමට අදාළව අමාත්‍යවරයා විසින් කලින් කල, සාමාන්‍ය හෝ විශේෂ විධාන ලිඛිතව නිකුත් කරනු ලැබිය හැකි අතර, එම විධාන බලාත්මක කිරීම මණ්ඩලයේ කාර්යය වන්නේ ය.

අමාත්‍යවරයාගේ විධාන.

**20.** (1) ආයතනයේ යම් කාර්යයක් සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීමට අවශ්‍ය වන අවස්ථාවක සහ එම අත්කර ගැනීම අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන අවස්ථාවක, එම නිශ්චල දේපළ අවශ්‍ය වන කාර්යය (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ අර්ථානුකූලව පොදු කාර්යයක් ලෙස සලකනු

ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ආයතනය සඳහා නිශ්චල දේපළ අත්කර ගැනීම.

ලැබිය යුතු අතර, ඒ අනුව ඒ පනත යටතේ ආයතනය වෙනුවෙන් එම දේපළ අත්කර ගනු ලැබිය හැකි ය ; තව ද, එම අත්කර ගැනීම සම්බන්ධයෙන් ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ආයතනය වෙනුවෙන් යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම සඳහා ගෙවිය යුතු යම් මුදලක්, ආයතනය විසින් ගෙවනු ලැබිය යුතු ය.

රජයේ නිශ්චල සහ චංචල දේපළ ආයතනය වෙත ලබා දිය යුතු බව.

**21.** (1) ආයතනයේ යම් කාර්යයක් සඳහා රජයේ යම් නිශ්චල දේපළක් අවශ්‍ය වන අවස්ථාවක, එම කාර්යය (454 වන අධිකාරය වූ) රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ ඒ දේපළ සම්බන්ධයෙන් විශේෂ ප්‍රදානයක් හෝ බදු දීමක් හෝ කළ හැකි කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව, ඒ ආඥා පනතේ විධිවිධාන ආයතනයට ඒ දේපළ විශේෂයෙන් ප්‍රදානය කිරීම හෝ බදු දීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) ආයතනයේ යම් කාර්යයක් සඳහා රජයේ යම් චංචල දේපළක් අවශ්‍ය වන අවස්ථාවක, එම දේපළෙහි පාලනය භාරව සිටින අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, එම චංචල දේපළෙහි සන්තකය සහ පරිහරණය, ආයතනය වෙත පවරා සතු කරනු ලැබිය හැකි ය.

දරන ලද වියදම් අරමුදලින් ගෙවිය යුතු බව.

**22.** මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත ආයතනය විසින් මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අධ්‍යක්ෂවරයකු හෝ යම් නිලධරයකු හෝ සේවා නියුක්තිකයකු විසින් සිදු කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක, ආයතනයට හෝ එම තැනැත්තාට එරෙහිව පවරන ලද සිවිල් හෝ අපරාධ නඩුවක දී, ආයතනය හෝ එම තැනැත්තා විසින් දරන ලද වියදම්, එම ක්‍රියාව සද්භාවයෙන් කර ඇති බවට අධිකරණය තීරණය කරන්නේ නම්, ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, මේ වගන්තියේ සඳහන් යම් තැනැත්තකු හෝ ආයතනය විසින් ලබා ගත් හෝ අයකර ගන්නා ලද යම් නඩු ගාස්තුවක්, ආයතනයේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

සාමාජිකයන් ආදීන්ට එරෙහිව කිසිදු රීට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

**23.** ආයතනයට එරෙහිව පවරන ලද යම් නඩුවක දී මණ්ඩලයේ යම් සාමාජිකයකුට, අධ්‍යක්ෂ ජනරාල්වරයාට, අධ්‍යක්ෂවරයකුට හෝ ආයතනයේ යම් නිලධරයකුට හෝ සේවා නියුක්තයකුට එරෙහිව හෝ එකී තැනැත්තකුගේ දේපළට එරෙහිව, කිසිදු රීට් ආඥාවක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

**24.** (අ) මේ පනතේ 18 වන වගන්තිය යටතේ නියම කර ඇති පරිදි යම් තොරතුරක් හෝ යම් ලේඛනයක් ඉදිරිපත් කිරීම පැහැර හරින ; වැරදි.

(ආ) ඉදිරිපත් කරන යම් තොරතුරක, දැන දැනම යම් සාවද්‍ය ප්‍රකාශයක් ඇතුළත් කරන ; හෝ

(ඇ) මේ පනතේ විධිවිධාන හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් උල්ලංඝනය කරමින් ක්‍රියා කරන,

සෑම තැනැත්තෙක් ම මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කිරීමේ දී, රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම, ඔහු යටත් වන්නේය.

**25.** (27 වන අධිකාරය වූ ) අල්ලස් පනතේ අර්ථානුකූලව ආයතනය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන ඒ අනුව කියවා තේරුම් ගත යුතු ය. අල්ලස් පනතේ අර්ථානුකූලව ආයතනය උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

**26.** මණ්ඩලයේ සියලුම සාමාජිකයන්, අධ්‍යක්ෂ ජනරාල්වරයා, අධ්‍යක්ෂවරුන් සහ ආයතනයේ සියලුම නිලධරයන් සහ ආයතනයේ සේවා නියුක්තයන් (19 වන අධිකාරය වූ ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා, රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය. ආයතනයේ සාමාජිකයන්, අධ්‍යක්ෂ ජනරාල්වරයා, අධ්‍යක්ෂවරුන්, නිලධරයන් සහ සේවානියුක්තයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**27.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මේ පනත යටතේ රීති සෑදීමට බලය පවරා ඇති හෝ නියම කර ඇති සියලු කාරණා සම්බන්ධයෙන් මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය. රීති.

(2) මණ්ඩලය විසින් සාදනු ලබන සෑම රීතියක් ම අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දින සිට හෝ එහි සඳහන් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**28.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**29.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ—

"පළාත් පාලන ආයතනය" යන්නෙන් මහනගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යයවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නාවූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්යය සහ කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම සඳහා යම්කිසි නීතියක් මගින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ ;

"පළාත් සභාව" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය යටතේ පිහිටුවන ලැබූ පළාත් සභාවක් අදහස් වේ ; සහ

"පේෂකර්ම හා ඇඟලුම් කර්මාන්තය" යන්නට, පාවහන් සහ පේෂකර්ම සහ ඇඟලුම් කර්මාන්තය ආශ්‍රිත හෝ ඊට සම්බන්ධ සහ අදාළ වෙනත් කර්මාන්ත ද ඇතුළත් වේ.

V වන කොටස

**ඉවත් කිරීම් සහ ව්‍යාවර්තන**

1984 අංක 3 දරන පනත සහ 1984 අංක 4 දරන පනත ඉවත් කිරීම.

**30.** (1) 1984 අංක 3 දරන ඇඟලුම් නිෂ්පාදන කර්මාන්ත අභ්‍යාස ආයතනය පනත සහ 1984 අංක 4 දරන පේෂකර්ම අභ්‍යාස සහ සේවා මධ්‍යස්ථානය පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) (1) වන උපවගන්තියේ සඳහන් පනත් ඉවත් කිරීම නොතකා—

(අ) නියමිත දිනයට පෙරතුවම වූ දිනයේ දී 1984 අංක 3 දරන ඇඟලුම් නිෂ්පාදන කර්මාන්ත අභ්‍යාස ආයතනය පනතේ 22 වන වගන්තිය මගින් පිහිටුවන ලද අරමුදලේ ඉතිරිව

ඇති මුදල් සහ 1984 අංක 4 දරන පේෂකර්ම අභ්‍යාස හා සේවා මධ්‍යස්ථානය පනතේ 23 වන වගන්තිය මගින් පිහිටුවන ලද අරමුදලේ ඉතිරිව ඇති මුදල්, නියමිත දිනයේ සිට බලපවත්නා පරිදි මේ පනතේ 11 වන වගන්තිය මගින් පිහිටුවනු ලැබූ ආයතනයේ අරමුදලට මාරු කරනු ලැබිය යුතු ය ;

(ආ) නියමිත දිනට පෙරාතුව ම වූ දිනයේ දී ඇඟලුම් නිෂ්පාදන කර්මාන්ත අභ්‍යාස ආයතනය සහ පේෂකර්ම අභ්‍යාස සහ සේවා මධ්‍යස්ථානය විසින්, ඒ ආයතන සමග හෝ ඒ ආයතන වෙනුවෙන් දරන ලද සියලු ණය, බැඳීම්, වත්කම් සහ බැරකම් සහ එළඹුනු සියලු කොන්ත්‍රාත්, ඔප්පු, බැඳුම්කර සහ ගිවිසුම් සහ ඉටු කළ යුතු සියළු කාරණා සහ දේවල්, නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි ආයතනය විසින්, ආයතනය සමග හෝ ආයතනය වෙනුවෙන් දරනු ලැබූ ණය, බැඳීම්, වත්කම් හා බැරකම් ලෙස ද, ලියා අත්සන් කරනු ලැබූ හෝ එළඹුනු කොන්ත්‍රාත්, ඔප්පු, බැඳුම්කර හා ගිවිසුම් ලෙස හෝ ඉටු කිරීම සඳහා නියැලුනු කාරණා සහ දේවල් ලෙස ද සලකනු ලැබිය යුතු ය ;

(ඇ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඇඟලුම් නිෂ්පාදන කර්මාන්ත අභ්‍යාස ආයතනයේ සහ පේෂකර්ම අභ්‍යාස සහ සේවා මධ්‍යස්ථානයේ සියලු නිලධරයන්ට සහ සේවා නියුක්තයනට ආයතනයේ සේවා නියුක්තිය පිරිනමනු ලබන අතර—

(i) එම සේවා නියුක්තිය භාර ගන්නා තැනැත්තකු, එම සේවා නියුක්තිය පිළිගැනීමේ දිනයේ දී ඔහුට අදාළ වූ සේවා නියුක්තිය පිළිබඳ නියම සහ කොන්දේසිවලට වඩා අඩුවෙන් වාසිදායක නොවන නියම හා කොන්දේසි මත, නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි ආයතනයේ සේවයේ නියුක්ත විය යුතු ය ; නැතහොත්

(ii) එම සේවා නියුක්තිය භාර නොගන්නා තැනැත්තකුට, කම්කරු විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන විශ්‍රාම ප්‍රතිලාභ නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි ලබා ගැනීමට හිමිකම ඇත්තේ ය ;

(ඈ) අවස්ථාවෝචිත පරිදි, ඇඟලුම් නිෂ්පාදන කර්මාන්ත අභ්‍යාස ආයතනය හෝ පේෂකර්ම අභ්‍යාස සහ සේවා මධ්‍යස්ථානය විසින් හෝ ඒවාට එරෙහිව යම් අධිකරණයක හෝ විනිශ්චය අධිකාරියක පවරනු ලැබ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී අවසන් නොවී පවතින සියලුම සිවිල් හෝ අපරාධ නඩු, අභියාචනා හෝ වෙනත් නීති කෘත්‍ය, නියමිත දිනයේ සිට බලපවත්වන පරිදිආයතනය විසින් හෝ එයට එරෙහිව පවරා ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව අඛණ්ඩව පවත්වාගෙන යා හැකි ය ;

(ඉ) අවස්ථාවෝචිත පරිදි, ඇඟලුම් නිෂ්පාදන කර්මාන්ත අභ්‍යාස ආයතනයේ හෝ පේෂකර්ම අභ්‍යාස සහ සේවා මධ්‍යස්ථානයේ වාසියට හෝ ඒවාට එරෙහිව නිසි අධිකරණ බලයක් ඇති අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් විසින් වාර්තා කරනු ලැබ හෝ ප්‍රදානය කරනු ලැබ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඉටු නොකර පවතින සියලු තීන්දු ප්‍රකාශ, ආඥා සහ නඩු තීන්දු, නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි ආයතනයේ වාසියට හෝ ඊට එරෙහිව වාර්තා ගත කර ඇති හෝ ප්‍රදානය කර ඇති තීන්දු ප්‍රකාශයක්, ආඥාවක් හෝ නඩු තීන්දුවක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව බලාත්මක කළ හැකිය ;

(ඊ) අවස්ථාවෝචිත පරිදි, ඇඟලුම් නිෂ්පාදන කර්මාන්ත අභ්‍යාස ආයතන හෝ පේෂකර්ම අභ්‍යාස සහ සේවා මධ්‍යස්ථානය සතුව පවතින හෝ නීත්‍යානුකූලව මිලදී ගත් හෝ අත්කර ගත් හෝ බදු ගනු ලැබූ හෝ ඒවායේ ප්‍රයෝජනය සඳහා තබා ඇති හෝ වෙනත් ආකාරයකින් පවරනු ලැබ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඒවායේ සන්තකය හෝ පාලනය යටතේ පවතින සියලු චංචල සහ නිශ්චල දේපළ, නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි එම දිනයේ දී ඒ හා සම්බන්ධ වන හා බැඳුනු හෝ අදාළ වන නියම සහ කොන්දේසි වලට යටත්ව ආයතනය වෙත පවරනු ලැබිය යුතු ය ; සහ

(උ) ඇඟලුම් නිෂ්පාදන කර්මාන්ත අභ්‍යාස ආයතනය සහ පේෂකර්ම අභ්‍යාස සහ සේවා මධ්‍යස්ථානය විසින් සාදනු ලැබ නියමිත දිනයේ දී බලපවත්නා වූ ද, මේ පනතේ විධිවිධානවලට හෝ එය යටතේ සාදන ලද යම් නියෝග හෝ රීතිවලට අනනුකූල නොවන්නාවූ ද, සෑම රීතියක් ම

නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි මේ පනත යටතේ සාදනු ලැබූ රීතියක් ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනත යටතේ සාදන ලද යම් රීති මගින් සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

**උපලේඛනය**

(3(3) වන වගන්තිය)

**මණ්ඩලයේ සාමාජිකයන්ට අදාළ විධිවිධාන**

1. මණ්ඩලයේ යම් සාමාජිකයෙක්—

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වන්නේ නම් හෝ වුවහොත් ;

(ආ) ආයතනය විසින් හෝ එය වෙනුවෙන් ඇති කරගත් යම් ගිවිසුමක් යටතේ කෙලින්ම හෝ වක්‍රාකාරයකින් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් දරන්නේ නම් හෝ භුක්ති විඳින්නේ නම් ;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල පුද්ගලයකු බවට තීරණය කරනු ලැබ ඇත්නම් හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත්නම් ;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවතින යම් නීතියක් යටතේ බුන්වත් බවට හෝ බංකොලොත් බවට ප්‍රකාශයට පත් කරනු ලැබ, බුන්වත්භාවයෙන් හෝ බංකොලොත්භාවයෙන් නිදහස් කරනු ලැබ නොමැති නම් ; හෝ

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් වරදකට වරදකරු කර ඇති තැනැත්තකු නම්,

එම තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කිරීමට හෝ අඛණ්ඩව එසේ සිටීමට නුසුදුස්සකු වන්නේ ය.

2. මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් කලින් ධුරය අත්හැරියහොත් මිස, මණ්ඩලයේ සෑම පත් කළ සාමාජිකයෙක් ම පත් කිරීමේ දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා ධුර දැරිය යුතු අතර, නැවත පත් කිරීම සඳහා ද සුදුස්සකු වන්නේ ය.

3. මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයෙක් තත්කාර්යය සඳහා අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් කවර හෝ අවස්ථාවක දී තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් පිළිගනු ලැබීමේ දී එය බලාත්මක විය යුතු ය.

4. අමාත්‍යවරයා විසින් සුදුසුයයි සලකනු ලබන්නේ නම්, මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකු හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

5. යම් පත් කළ සාමාජිකයකු මිය යාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සිදු වූ විට, අමාත්‍යවරයා විසින් 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඒ තැනැත්තා සඳහා අනුප්‍රාප්තවීමට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය. එසේ පත් කරනු ලබන තැනැත්තා තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ඉතිරි ධුර කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

6. රෝගාතුර වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකුට තාවකාලික තම ධුරයේ කටයුතු ඉටු කළ නොහැකි අවස්ථාවක, අමාත්‍යවරයා විසින් 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන ඔහු වෙනුවට වැඩ බැලීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

7. මණ්ඩලයේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් තිබීමේ හේතුවෙන් හෝ යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුවෙන්, මණ්ඩලයේ යම් ක්‍රියාවක් තීරණයක් හෝ කටයුත්තක් අවලංගු නොවිය යුතු ය.

8. මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන යම් පාරිශ්‍රමිකයක්, මණ්ඩලයේ සාමාජිකයන් වෙත ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

9. (1) මණ්ඩලයේ සියලු රැස්වීම්වලදී සභාපතිවරයා මුලසුන දැරිය යුතු අතර, සභාපතිවරයා නොපැමිණි විට එම රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින්, එම රැස්වීමේ මුලසුන දැරීම සඳහා යම් සාමාජිකයකු පැමිණ සිටින සාමාජිකයන් අතුරින් තෝරා පත් කර ගත යුතු ය.

(2) මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණය කරනු ලැබීම සඳහා වන සියලු ප්‍රශ්න සාමාජිකයන්ගේ වැඩි ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු අතර, මණ්ඩලයේ එම රැස්වීමේදී තීරණය කළ යුතු කාරණය පිළිබඳව ඡන්ද සමානව ඇති විට, එම රැස්වීමේ මුලසුන දරන සාමාජිකයාට තම ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(3) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා වූ ගණපූරණය සාමාජිකයන් පස් දෙනකු විය යුතු ය.

(4) මේ ඡේදයේ ඉහතින් වූ විධිවිධානවලට යටත් ව මණ්ඩලයේ රැස්වීම්වලදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ එම රැස්වීම්වලදී කටයුතු කළ යුතු ආකාරය පාලනය කරන රීති මණ්ඩලය විසින් සාදනු ලැබිය හැකි ය.

10. (1) ආයතනයේ මුද්‍රාව මණ්ඩලයේ විසින් නිශ්චය කරනු ලබන පරිදි විය යුතු ය.

(2) ආයතනයේ මුද්‍රාව—

(අ) මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලබන යම් තැනැත්තකු හෝ තැනැත්තන් භාරයේ තැබිය යුතු ය ;

(ආ) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය ; සහ

(ඇ) තමන් පැමිණ සිටි බවට සාක්ෂියක් වශයෙන් එම සාධන පත්‍රයේ හෝ ලේඛනයේ තම අත්සන තැබිය යුතු මණ්ඩයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු ය.

(3) ආයතනයේ මුද්‍රාව තබනු ලැබූ සියලු සාධන පත්‍ර හෝ ලේඛනවල රෙජිස්ටරයක් පවත්වාගෙන යාමට මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.